- **අලංකාර පද නිර්මාණය**

නර්තනයක් යනු විධිමත් සංචලන හැසිරවීමකි. නර්තනයක අලංකාරය වැඩි වන්නේත්, ප්‍රාසංගික ලක්ෂණ ඉස්මතු වන්නේත් චලන විධිමත් ව ගොඩනැඟී ඇත්නම් පමණි. නර්තනයක් නැරඹීමෙන් රසයක් විඳීමට නම් සිතට ප්‍රිය උපදවන හැඩතල එහි අන්තර්ගත විය යුතු ය. සම්ප්‍රදායයට අදාළ ව චලන හා අංගහාර මනා පරිකල්පනයකින් විචිත්‍ර ව යොදා ගැනීම අලංකාර මාත්‍රා (පද) නිර්මාණය ලෙස හැඳින්විය හැකි ය.

නර්තනයට ද අලංකාර මාත්‍රා (පද) නිර්මාණය කර ගැනීම මගින් එහි විචිත්‍රත්වයක් ගොඩ නැඟිය හැකි වනවා මෙන් ම ප්‍රේක්ෂකයන්ට වැඩි රසයක් ලබා දීමට ද එය ඉවහල් වනු ඇත.

- **අලංකාර පද/මාත්‍රා නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු**

  - අදාළ තාල රූපයේ ගති ලක්ෂණ ඉස්මතු වන පරිදි අලංකාර මාත්‍රා නිර්මාණය කිරීම.
  - සම්ප්‍රදායයට අනුව පාද චලන හා අංගහාර නිසි ලෙස පවත්වා ගැනීම.
  - සමබරතාව ආරක්ෂා වන පරිදි සැහැල්ලු, වේගවත් හා විවිධ ස්වරූපයන් ගෙන් යුත් චලන භාවිත කිරීම.
  - ඉහළ, මැද හා පහළ තලයන්ට අදාළ චලන යොදා ගැනීම, දිසා භාවිතය මෙන් ම සම්බන්ධතා නිසි ලෙස පවත්වා ගෙන යෑම.
  - කැරකීම්, පැනීම්, සුරල් ආදිය සම්මිශ්‍රණය කරමින් මාත්‍රා නිර්මාණය කිරීම.
  - ප්‍රාසංගික බවින් යුතු ව අලංකාර මාත්‍රා නිර්මාණය කිරීම.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සුළු මහ දෙතිතට (මාත්‍රා 2 + 4 දෙතිතට) උචිත අලංකාර මාත්‍රා දෙකක් නිර්මාණය කරන්න. (කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව)

- ගුරු උපදෙස් අනුව මාත්‍රා 2 + 4 තාල රූපයට උචිත අලංකාර මාත්‍රා පද තෝරා ගන්න.
- බෙර වාදනයට අනුව අලංකාර මාත්‍රා (පද) ඉදිරිපත් කරන්න.
- එම අලංකාර මාත්‍රා (පද) නියමිත අංගහාර භාවිත කරමින් අභ්‍යාස කරන්න.
- සුළු මහ දෙතිතට අයත් වන්නම් නර්තනයක් හෝ නිර්මාණාත්මක නර්තන අංගයක් හෝ සඳහා මෙම අලංකාර මාත්‍රා භාවිත කරන්න.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)